RARE

# පැරණි ලක්දිව රාජ්‍ය පාලකයන්ගේ පෞද්ගලික චර්යා පිළිබඳ විමර්ශනයක්

ටී.ආර්. අග්‍රා දමයන්ති කුමාරි

FGS/HIST/MSSc/10/003

සමාජීය විද්‍යාපති ඉතිහාසය උපාධියෙහි අවශ්‍යතාවක් පූර්ණය කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි

ප්‍රවේශ අංකය: 1261
වර්ග අංකය:

නොවැම්බර් 2016

## සංක්ෂේපය

දේශීය සාහිත්‍යය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් අනාවරණය කෙරෙන්නේ හුදෙක් මෙරට රජු කේන්ද්‍ර කරගත් දේශපාලන ඉතිහාසයක් හා බුදුදහම කේන්ද්‍රකරගත් ආගමික ඉතිහාසයකි. සමාජයීය, ආර්ථික හා සංස්කෘතික තොරතුරු අතලොස්සකි. ලක් රජවරුන්ගේ සේවය අගය කරමින් ඉතිහාස තොරතුරු රචනාකර ඇති නමුත් ඔවුන්ගේ පෞද්ගලික ජීවිතවල සැඟවී ගත් තොරතුරු ඒවායින් අනාවරණය නොවේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ මෙරට රාජ්‍ය පාලකයන්ගේ පෞද්ගලික ජීවන චර්යා පිළිබඳවත් එම චර්යා මෙරට දේශපාලන, ආර්ථික හා සමාජීය අංශ කෙරේ බලපෑ ආකාරය පිළිබඳවත් අධ්‍යයනය කිරීම යි. අධ්‍යයන සීමාව වන්නේ ක්‍රි.පූ. 6 වන සියවසේ සිට පොළොන්නරු යුගයේ අවසානය දක්වා ය. රාජ්‍ය පාලකයන්ගේ පෞද්ගලික චර්යා පිළිබඳව ප්‍රාථමික මූලාශ්‍රය මඟින් අනාවරණය වන්නේ ද සීමිත තොරතුරු ප්‍රමාණයකි. එම කරුණුවල සීමිත භාවය වූ කලී ඉතිහාස පර්යේෂකයා මුහුණපාන බලවත් ගැටලුවකි.

මෙම පර්යේෂණයේදී සාහිත්‍ය, පුරාවිද්‍යා මූලාශ්‍රය මෙන් ම පුරාවෘත්ත හා ජනප්‍රවාද ද ඇසුරු කරගත් අතර එමඟින් මෙරට රජුන්ගේ පෞද්ගලික ජීවිතයේ සැඟවුණු බොහෝ තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. ඇතැම් කතුවරුන් හුදෙක් පක්ෂපාතීභාවය නිසා රජවරුන්ගේ පෞද්ගලික ජීවිතය පිළිබඳව තොරතුරු හෙළි නොකර පුහු වීරත්වයක් පමණක් ආරූඪ කර ඇත. එවන් කරුණු හෙළිදරව් කරමින් රජුන්ගේ පෞද්ගලික හැසිරීම හා කාර්යභාරය, දින චර්යාව, අධ්‍යාපනය ආදී කරුණු සම්බන්ධයෙන් ද අගමෙහෙසිය, වල්ලභ බිසෝවරු, අන්තඃපුරය ඇතුලු රජුගේ කාමභෝගී දිවි පැවැත්ම පිළිබඳවත්, ඥාතිමිත්‍ර සම්බන්ධතා ඇතුලු සමාජ සම්බන්ධතා පිළිබඳවත්, ඇඳුම් පැළඳුම්, ආහාරපාන, විනෝදස්වාද කටයුතු ආදිය පිළිබඳව මෙන් ම ඒ ඒ පාලකයන්ට ආවේණික හැසිරීම් රටා ලංකා ඉතිහාසය කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳව මෙහිදී අවධානය යොමු කෙරේ.

ඒ අනුව රාජ්‍ය පාලකයන්ගේ පෞද්ගලික ජීවිත හා බැඳුණු චර්යා රටා මෙරට දේශපාලන හා සමාජීය ක්ෂේත්‍රය සඳහා සෘජු බලපෑමක් එල්ලකර ඇත. රාජ්‍ය පාලනයේ යහපැවැත්ම තීරණය වී ඇත්තේ ඒ අනුව ය. ඒ අනුව පාලකයන්ගේ පෞද්ගලික හැසිරීම ඔවුන්ගේ ජීවන තත්ත්වය හැඩ ගැසීම කෙරෙහි මෙන් ම රටේ ජනතාවගේ හා රාජ්‍යයේ පැවැත්ම කෙරෙහි ද එකසේ බලපා ඇතැයි මෙහිදී නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :-** රජු, ජීවන චර්යා, අග මෙහෙසිය, අන්තඃපුරය, පුරාවෘත්ත

## Abstract

Literature and Archeological sources only reveal about the king centered political history and Buddhist religion centered religious history. Sociological, economic and cultural contents are very rare to be found. Information about admiring services of the king was written often but they do not reveal about the kings personnel hidden lifestyle. The primary objective of this research is to study on the personnel lifestyle of Sri Lankan Kings and how their lifestyles influenced on the political, economic and sociological aspects of the country. The boundary of this study is from 6 BC to the end of polonnaruwa era. Preliminary information about personnel life patterns of the king is limited therefore these lack of information is a major limitation faces by the researcher.

This research is based on literature revives, archeological sources, and legends. These sources provide enough evidences to reveal many hidden information about the personnel life of kings. Some authors were trying to build a chivalry of the king which never exists with those kings due to their loyalty on the king; they do not provide any information about the personnel life of the king. This research reveals these hidden information about the king such as, the personnel behavior, social lifestyle, education, social connections, food habits, and also it reveals about the kings relationships with friends and family, queens, consorts, and his sexual lifestyle, harem, and entertainment patterns. This study also focuses on how the above factors affected Sri Lankan history.

It was found that the behavioral patterns associated with the lifestyle of ruling bodies have affected the country's political and social aspects directly. The governments' righteousness was decided based on the above aspects, thus the personnel behavior of the king has affected his own status of life, and also it has affected the country.

Keywords: King, Lifestyles, queen, harem, legend